ලංකා ජලනි
லங்கா ஜலனி
Lanka Jalani

# දේශගුණික වෙනස්වීම

## ඔබට බලපාන්නේ කෙසේද?





ජල අර්බුදය
ජල චක්‍රයේ සංසරණය වන ජල ප්‍රමාණය නියත වීම
ජල ඉල්ලුම ඉහළ යාම
ජලය දූෂණය වීම
දේශගුණය වෙනස්වීම
ජනගහණය වැඩි වීම
ජීවන ක්‍රියාකාරකම් වර්ධනය
ස්වභාවධර්මයේ ක්‍රියාකාරකම්


රූප සටහන 2

## දේශගුණය - හැඳින්වීම

දේශගුණය යනු උෂ්ණත්වය, වර්ෂාපතනය, තෙතමනය වායු පීඩනය සුළං සහ සුළගේ වේගය යන දෛනික කාලගුණ අංගයන්ගේ දිගුකාල හැසිරීමේ සාමාන්‍ය තත්වයයි.

දේශගුණික හැසිරීම විවිධ භෞතික හා මානව කරුණු කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරනවා මෙන්ම දේශගුණය කෙරෙහි ද භෞතික හා මානව සිද්ධීන් බලපානු ලබයි. ඒ අනුව දේශගුණය හා මිනිසා අතර අන්‍යොන්‍ය රඳපැවැත්මක් ඇති බව ද පෙනේ.

දේශගුණික හා පරිසර තත්වයන් මත මිනිසාගේ ආර්ථික සාමාජීය හා සංස්කෘතික කටයුතු ගොඩ නැගේ.

භූගෝලීය කලාපයක, රටක, ප්‍රදේශයක, දේශගුණික තත්වයන්ට අනුරූපව ආර්ථික, සාමාජීය කටයුතු සංවිධානය වී තිබෙන බැවින් දේශගුණික වෙනස්කම් මිනිසාගේ මෙන්ම පරිසරයේ පැවැත්මට ද බාධාකාරී වෙයි.

## දේශගුණික තත්වය වෙනස් වෙමින් පවතින්නේ ද?

ලෝකයේ සෑම භූගෝලීය කලාපයකම අඩුවැඩි වශයෙන් පසුගිය වසර 20 ක පමණ කාලය තුළ දේශගුණික වෙනස්කම් ඇති වී තිබෙන බව පිළිගැනේ. ඊට සාධක වශයෙන්

- 1905 සිට 2005 දක්වා වසර සියයක කාලය තුළ වායුගෝලීය උෂ්ණත්වය $0.11^{C}$ සිට $0.74^{C}$ දක්වා අගයකින් සෑම කලාපයකම උෂ්ණත්වය වැඩි වී ඇති බව සංඛ්‍යාත්මකව තහවුරු වී ඇත.

- 1966 න් පසුව වාර්ෂික උෂ්ණත්වය වැඩි වීමේ වේගය දේගුණයකින් වැඩි වී ඇති බව අවධාරණය කර ඇත.

- එමෙන්ම වාර්ෂිකව මුහුදු ජලයේ උෂ්ණත්වය ද සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ යන අතර ඊට සාධකයක් ලෙස ධ්‍රැව ආශ්‍රිත මුහුදු අයිස් තට්ටු දියවීම උදාහරණ ලෙස පෙන්වා දී තිබේ.

- වර්ෂාපතනයේ සනත්වය හා සීඝ්‍රතාව ඉහළ යමින් පවතී.

- වාර්ෂිකව වර්ෂාපතනය ලැබෙන දින ගණන අඩුවීම ද වර්ෂාපතන සනත්වය (ප්‍රමාණය) වැඩි වීම ද සංඛ්‍යාත්මකව තහවුරු වී ඇත.

- ඍතු අනුව දේශගුණයේ වෙනස්වීම් වල විශේෂතා අඩුවෙමින් පවතී.

**දේශගුණික වෙනස්වීම් කෙරෙහි බලපානු ලබන ප්‍රධාන සාධක කොටස් දෙකකි.**

ස්වභාවික සාධක

මානව සාධක

**ස්වාභාවික සාධක**

1. සූර්ය කිරණ ප්‍රමාණය වෙනස්වීම
2. පෘථිවියේ ගමන්මාර්ගය/ සූර්යයාගේ කක්ෂය වෙනස් වීම
3. හරිතාගාර ආවරණ බලපෑම

**මානව සාධක**

1. හරිතාගාර ආවරණ ක්‍රියාවලියේ උත්ප්‍රේරණය (කාර්මීකරණය පොසිල ඉන්ධන, රසායනික ද්‍රව්‍ය නිරාවරණය)
2. අධික හා අනිසි භූමි පරිභෝගය
3. සංවේදී පරිසර පද්ධති ආක්‍රමණය
4. මානව ක්‍රියාකාරකම් මගින් වායුගෝලයට රසායනික හා දූවිලිමය අංශු එකතු කිරීම

**දේශගුණික වෙනස්වීම් මගින් ඇතිකරන බලපෑම්**

දේශගුණික වෙනස්වීම් මගින් ඇති කෙරෙන බලපෑම අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක මත රඳාපැවතිය ද එම බලපෑම් ඍජු හා වක්‍ර ලෙස කොටස් කළ හැකි ය.

## සෘජු බලපෑම්

- වර්ෂාපතනයේ වෙනස්වීම
- උෂ්ණත්වය ඉහළ යාම
- සාගර ජල මට්ටම ඉහළ යාම
- ගංවතුර හා දැඩි සුළඟ
- යටිතල පහසුකම් විනාශ වීම
- මිනිස් ජීවිත හා දේපළ විනාශ වීම

## වක්‍ර බලපෑම්

- කෘෂිකාර්මික නිෂ්පාදන හා ඵලදායිතාවය පහළ යාම
- ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ගැටළුව
- අධික වාෂ්පීකරණය
- ලවණතාවය ඉහළ යාම
- ග්ලැසියර හා අයිස් දියවීම
- කුඩා දූපත් සාගර ජලයෙන් යටවීම
- වෙරළබඩ පහත් බිම් යටවීම
- ජල සැපයුම සීමා වීම
- පෝෂණ මට්ටම පහළ වැටීම
- සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිරිහීම
- පරිසර පද්ධති විනාශ වීම

## දේශගුණික වෙනස්වීම් වලින් අභියෝගයට ලක්වන ප්‍රමුඛ කණ්ඩායම්

1. දිළිඳු ජනතාව
2. සුළු පරිමාණ ගොවීන්
3. සුළු පරිමාණ ධීවරයන්
4. කුඩා දරුවන්
5. වන සතුන් හා පරිසර පද්ධතීන්

## දේශගුණික වෙනස්කම් නිසා ක්ෂණිකව හා තීව්‍ර ලෙස හානියට පත්වන ස්වාභාවික සම්පත්

1. මිරිදිය ජලය
2. කෘෂිකාර්මික බිම්
3. පරිසර පද්ධති

ස්වභාව ධර්මය විසින් ජීවීන්ට ලබාදුන් මූලිකම දායාදය ජලය ලෙස සැලකේ. ජලය ලෝකයේ ජීවය ලෙස සලකනු ලබන්නේ එහෙයිනි. පෘථිවිය මතුපිට වෙසෙන මිනිස් වර්ගයා සතුන් ගහ කොළ හා පරිසර පද්ධති සියල්ලේම ජීවය හා ක්‍රියාකාරකම් කෙරෙහි ජලය සෘජු බලපෑමක් ඇති කරන අතර වර්ෂාපතනය පෘථිවියට මිරිදිය ජලය ලබා දෙන ක්‍රමෝපාය වේ. වැසි ඇති වීම හා එමගින් ජලය ලැබීම චක්‍රාකාරව සිදුවන බැවින් එයට ජල චක්‍රය යැයි කියනු ලැබේ.

2. රූප සටහන

**ජලයේ පොදු ලක්ෂණ**

1. ජල ගෝලය තුළ ඇති ප්‍රයෝජනයට ගත හැකි ජල පරිමාව වෙනස් නොවේ.
2. ජලය පරිහරණය කිරීමෙන් අවසන් නොවේ.
3. එය ගතික ස්වභාවයකින් යුතු වන අතර ස්වයංක්‍රීයව/ චක්‍රීයව පිරිසිදු වේ.

**ජල ගෝලයේ සංයුතිය**

1. කරදිය 96.5%
2. අයිස් හා ග්ලැසියර 1.75%
3. භූගත ජලය 1.39% (කරදිය මිරිදිය මිශ්‍ර)
4. මිරිදිය 0.36%
5. පිනි තුහින 0.001%
6. ජල වාෂ්ප 0.001%

3.5% ක පමණ ප්‍රතිශතයක් මිරිදිය ජලය ලෙස පැවතිය ද මිනිසාට හා පරිසරයට ප්‍රයෝජනයට ගත හැකි වන්නේ 01% කට වඩා අඩු ප්‍රතිශතයකි. එම ප්‍රමාණය නියතයක්ව පවතී. සචේතනික මෙන්ම අචේතනික පිරිස් ද ජලය මත යැපෙන බැවින් ඒ සඳහා තරඟයේ යෙදෙති. දේශගුණය වෙනස්කම් නිසා ඉහත ලෙස ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වයෙන් වර්ෂාව ලෙස පොළොවට පතිත වන ජලයේ ප්‍රමාණය, කාලය, කාල වකවානුව හා ස්වභාවය වෙනස්වීම ජලය බෙදා ගැනීමේ ගැටලු ඇති කරයි. එමෙන් ම දේශගුණික වෙනස්කම් නිසා පසේ තෙතමනය අඩුවීමත් පරිසරය උණුසුම් වීමත් නිසා නියඟකාරී තත්වයක් ඇති වුවහොත් ජල සැපයුම සීමා වීමෙන් අර්බුදකාරී තත්වයක්

පැන නැගිය හැකිය. මේ ආකාරයෙන් ජලයට ඇති ඉල්ලුම මුල් කරගෙන තරඟකාරීව ක්‍රියාකිරීමෙන් තව දුරටත් භාවිතයට ගත හැකි ජලයේ ප්‍රමාණය හා ගුණාත්මක බව අඩුවිය හැකි ය.

## ශ්‍රී ලංකාවේ ජල විභවය

ලෝක ජල තත්වය සමඟ සලකන විට ශ්‍රී ලංකාව සාපේක්ෂ වශයෙන් ඉහළ ජල විභවයකින් යුතු රටකි. ශ්‍රී ලංකාව නිවර්තන කලාපය තුළ පිහිටා ඇති දූපතක් වන බැවින් වසර පුරාම වර්ෂාපතනය අඩු වැඩි වශයෙන් ලැබේ. ඒ ඒ දේශගුණික කලාපවලට වාර්ෂිකව මි.මි. 700 ක සිට මි.මි. 5500 දක්වා වර්ෂාපතනයක් ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවට වාර්ෂිකව ඝන මීටර් දශලක්ෂ 43000 ක පමණ වර්ෂාපතනයක් ලැබේ. එයින් ඝන මීටර් දශලක්ෂ 12000 ක් පමණ වාරිමාර්ග කටයුතු සඳහා ගැනෙන අතර පානීය ජලය හා ගෘහස්ත පරිභෝජනය සඳහා ඝන මීටර් මිලියන දශලක්ෂ 3000 ක් ද භාවිතා කෙරේ. කර්මාන්ත සඳහා ඒ හා සමාන ප්‍රමාණයක් භාවිතා වන අතර ඉතිරිය පරිසරය හරහා මුහුදට ගලා යයි. ඒ අනුව ඒක පුද්ගල පරිභෝජනය සඳහා ජලය ඝන මීටර් 2260 ක් පමණ හිමි වුව ද ප්‍රාදේශීය වශයෙන් පවතින විෂමතාවන් හා වෙනත් හේතූන් මත මතුපිට ජල ව්‍යාප්තියේ විශාල පරතරයක් පවතින බව පෙනේ.

## දේශගුණික විපර්යාස වලට මුහුණ දීම

දේශගුණික වෙනස්කම් වලට මුහුණ දීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රම වේද දෙක හඳුනාගෙන තිබේ.

1. මානව ක්‍රියාකාරකම් නිසා වායුගෝලීය උෂ්ණත්වයේ සිදුවන වර්ධනය අවම කිරීම.
2. පවත්නා දේශගුණික වෙනස්වීම් වලට මුහුණ දීමේ හැකියාව වර්ධනය කර ගැනීම.

මානව ක්‍රියාකාරකම් හේතු කරගෙන වායුගෝලයේ උණුසුම් වීම වැලැක්වීම සඳහා දැනට සිදු කෙරෙන කාර්මික තාක්ෂණික හා ප්‍රවාහන කටයුතු නිසා වායුගෝලයට විමෝචනය වන අහිතකර වායුව සීමා කිරීම සඳහා භාවිතය අඩු කිරීම හා තාක්ෂණය වැඩි දියුණු කිරීම (කාර්මීකරණයෙන් 16.8% ක් ද ප්‍රවාහනයෙන් 14% ක් ද මහා පරිමාණ කෘෂිකාර්මික කටයුතු වලින් 12.5% ක් ද

කැනීම් කටයුතු වලින් 11.3% ක් ද පොසිල ඉන්ධන දහනයෙන් 10% ක් ද බලාගාර ක්‍රියාත්මක කිරීමෙන් 21.3% ක් ද අපද්‍රව්‍ය බැහැර කිරීම අනෙකුත් ක්‍රියාකාරකම් වලින් 13.7% ක් ද ලෙස වායු ගෝලයට අහිතකර වායු විමෝචනය වේ) ($CFC, CO_2, CH_4 N_2O$)

## දේශගුණික විපර්යාස වලට අනුගත වීම.

දේශගුණික වෙනස්වීම් වලට ප්‍රතිචාර ලෙස අහිතකර වායු විමෝචනය කිසියම් මට්ටමකට සීමා කරනු ලැබුව ද ස්වාභාවික හේතුන් මත ඇති වන වායුගෝලයේ උණුසුම් වීමත් ඒ මගින් ඇති කෙරෙන අහිතකර බලපෑම් සමනය කිරීම කළ නොහැකි බැවින් සිදුවන දේශගුණික වෙනස්කම් වලට අනුගතව ක්‍රියාකිරීම වඩාත් ප්‍රායෝගික බව විද්‍යාඥයින්ගේ මතය වේ. මේ සඳහා නව විද්‍යාත්මක හා තාක්ෂණික ක්‍රම මෙන්ම පාරම්පරික ඥානය ද ස්වභාවධර්මයේ සීමාවන් ද හඳුනාගෙන ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ.

## දේශගුණික වෙනස්වීම් සමනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

දේශගුණික විපර්යාස වලට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර හා ජාතික වශයෙන් දැනටමත් ඒකාබද්ධ ක්‍රියාමාර්ගයන් ගනිමින් සිටින අතර 1992 වර්ෂයේ ඩබ්ලින් සමුළුවත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1994 සම්මත කරන ලද දේශගුණ වෙනස්වීම් වලට මුහුණ දීම සඳහා වූ සම්මුතියත් ඉතා වැදගත් සංධිස්ථානයන් වන අතර 2002 කියෝතෝ සමුළුව මෙහි තවත් ඉදිරි පියවරකි.

## දේශගුණික බලපෑම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකාව මේ දක්වා ගෙන ඇති පියවර

1. ආයතනිකමය ක්‍රියාමාර්ග
2. ව්‍යාපෘතිමය ක්‍රියාමාර්ග

## ආයතනිකමය ක්‍රියාමාර්ග

1. මොරටුව හා පේරාදෙණියේ 2002 වර්ෂයේ පර්යේෂණ ආයතන පිහිටුවීම.

2. 1980, 1988 හා 2000 වර්ෂ වල සම්මත කළ හා සංශෝධනය වූ පාරිසරික පනත් වල ජල සම්පත් කළමණාකාරණය සම්බන්ධයෙන් නීතිරීති සකස් කර ඇත.

3. 2010 මහින්ද චින්තන හරිත ලංකා වැඩ සටහන යටතේ රන්දොර ජාතික වැඩසටහන යටතේ යටිතල පහසුකම් සංවර්ධනය ද වාරිමාර්ග සංවර්ධනය ද, 2012 සැමවිට සැමට ජලය සංකල්පය යටතේ ආරම්භ වුන වැඩසටහන් ද, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්ති වැඩ සටහන් යටතේ ද කාලගුණ වෙනස්කම් වලින් ජලය සැපයීම සඳහා සිදුවන බාධා ඉවත්කරලීමට කටයුතු කර ඇත. තව ද ක්‍රියාත්මක අංශය දුර්වල මට්ටමක පැවතිය ද ජල සැපයුම, ගුණාත්මක තත්වය, අපවහනය හා වාරිමාර්ග කටයුතු සම්බන්ධයෙන් අණපනත් 50 ක් පමණ සකස් කර ඇති අතර ආයතන 30 පමණ ක්‍රියාත්මක වේ.

තව ද නව වාරිමාර්ග ව්‍යාපෘති ලෙස මොරගහකන්ද, කළුගඟ, වෙහෙරගල මහඔය, කැකිරිඕබොඩ හා දැදුරුඔය වැනි විශාල වාරිමාර්ග රාශියක් ඉදිවෙමින් පවතී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මේ වන විටත් නියඟයට, ලවණතාවයට හා කෘමි උවදුරු වලට ඔරොත්තු දෙන අඩු වයස් වී වර්ග කීපයක් ද උද්‍යාන බෝග හා එළවළු වර්ග කීපයක් එළි දක්වා ඇත. (කව්පි, උඳු, මුං, බඩ ඉරිඟු, සෝයා බෝංචි)

ජල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවම බිම් සැකසීම, තෙත් හා වියළි වගා ක්‍රමය, සංතෘප්ත පාංශු වගාව, පැරචුට් වගා ක්‍රමය හඳුන්වා දී ඇත.

වී, උද්‍යාන බෝග, තේ, පොල්, රබර් හා අපනයන බෝග පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථාන 6 ක් පිහිටුවා ඇති අතර එමගින් නියඟට, දැඩි වර්ෂාවට හා වෙනත් කෘමි උවදුරු වලට ඔරොත්තු දෙන බෝග වර්ග හා වගා ක්‍රම හඳුනාගෙන ඇත.

මීට අමතරව වාරිමාර්ග හා පානිය ජල අවශ්‍යතා සඳහා පහත දැක්වෙන නව තාක්ෂණික ක්‍රම භාවිතය පුළුල් කර ඇත.

1. වැසි වතුර එකතු කිරීමේ වැඩසටහන්
2. ග්‍රාමීය වැව් පිළිසකර කිරීම
3. වාරිමාර්ග ජල කාර්යක්ෂමතා වැඩි කිරීම
4. පස හා ජල සංරක්ෂණ ක්‍රම භාවිතය
5. ජල පොකුණු භාවිතයෙන් ගලා යන ජලය රැස් කිරීම
6. නළ ළිං හා වගා ළිං (සූර්ය ශක්තියෙන් ක්‍රියා කිරීම)

දේශගුණික වෙනස්කම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ හා දේශගුණික වෙනස්කම් වලට අනුගත කිරීමේ වැඩසටහන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් ක්‍රියාත්මක කර ඇත.

## ජලය පරිහරණය කරන්නන් ලෙස ඔබගේ වගකීම

ජලය පරිහරණය කරන්නන් ලෙස ජල චක්‍රයේ කිනම් අවස්ථායක හෝ අපි ද ජල කළමණාකරුවන් වෙමු.

එබැවින්,

- අනාගත ජල අර්බුදය පිළිබඳ මනා දැනුමක්, අවබෝධයක් ලබා ගත යුතුය.
- ලබා ගත් දැනුම අන් අයට ලබා දීමට ක්‍රියාකළ යුතු ය.
- අනාගත ජල පරිහරණ සැලසුම් කිරීමේ දී ක්‍රියාකාරිව දායක විය යුතු ය.
- තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වලට සහයෝගය ලබා දිය යුතුය.
- ජල අර්බුදයට මුහුණ දීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගැනීමේ දී මූලිකත්වය දැරිය යුතුය.
- ජලය ධනය මෙන් ආරක්ෂා කිරීමට පෙරමුණ ගත යුතුය.

# තිරසාර ජල කළමණාකරණයක් සඳහා




- ජලය සීමිත වුවත් අවදානමට ලක්වුත් සම්පතකි. එය මනාලෙස කළමනාකරණය කර ගැනීම පරිහරණය කරන්නන්ගේ යුතුකමකි./වගකීමකි.

- ජල සම්පත් සංවර්ධනයේදි මෙන්ම කළමණාකරණයේදීත් භාරකරුවන් මෙන්ම පරිහරණය කරන්නන්ද සම්බන්ධ විය යුතුය. ජලය ප්‍රයෝජනයට ගැනීමේදී සියලුම අංශවල ජල අවශ්‍යතා ඉටුවන පරිදි ඒකාබද්ධව කළමනාකරණය කළ යුතුය.

- කාන්තාවන්ගේ මූලික භූමිකාව ජලය හා බැදී පවතින බැවින් ඔවුන්ගේ සහභාගිත්වය හා දායකත්වය වැදගත්ය.

- ජලය මූලික අවශ්‍යතාවයක් මෙන්ම ඊට විශාල ආර්ථික වටිනාකමක් ද ඇති බව අමතක නොකළ යුතුය.

# ජල සම්පත පිළිබඳ අපේ ස්ථාවරය

- ලංකා ජල සංසදය ජල සම්පත රටටත් ජනතාවටත් අයිති ස්වභාවික වස්තුවක් ලෙස සලකන අතර ඇතැම් රටවල මෙන් එහි කළමණාකරණයට බහු ජාතික සමාගම් වල මැදිහත් වීම තරයේ විරුද්ධ වන අතර එවැනි මැදිහත්වීම් වලින් මහජනතාවගේ ජල අයිතිය බිඳ වැටෙන බව පිළිගනී.

- ඒ අනුව, "භූ තලය සියලු මනුෂ්‍යයන්ට හා සත්වයන්ට අයිති වන අතර රජය එහි භාරකාරීත්වය දරයි." (මහා වංශය ක්‍රි.පූ.223) යන කියමන අනුව මනුෂ්‍යත්වය හා පරිසරය යන දෙකම අගය කරයි. සියලු ජීවීන්ගේ ප්‍රයෝජනය සඳහා රජය ජල සම්පත ආරක්ෂිතව භාවිතා කළ යුතු වස්තුවක් ලෙස සළකයි.

- ලංකා ජල සංසදය ඒකා බද්ධ ජල මූලාශ්‍ර කලමණාකරණ ක්‍රියාවලිය දිරිගැන්වීමට කැප වූ ද පරිසර හිතකාමී තුලනාත්මක සමාජ හා ආර්ථික සංවර්ධනයක් සඳහා රටේ ජල සම්පත චිරස්ථායීව භාවිතා කරන හා අගය කරන සමාජයක් අරමුණු කොට ක්‍රියා කරයි.

- පානීය හා ජීවනෝපාය සළසන ජලයට මුල් තැන දෙමින් මූලික මනුෂ්‍ය අවශ්‍යතාවයන්ට අවශ්‍ය ජලය ලබා ගැනීමේ හිමිකම තහවුරු කර ගනිමින් ජලය මූලික මානුෂික අයිතිවාසිකමක් ලෙස පිළිගනී.

- පානීය ජලය එය සපයන මූලාශ්‍ර ආරක්ෂා කර ගනිමින් වාරි කෘෂිකර්මාන්තය හා වී වගාව සඳහා ජලය ලබා දීම ජාතියේ ආහාර ආරක්ෂිතභාවයට අවශ්‍ය බව අවධාරණය කරයි.

- පාරම්පරික ජලකළමණාකරණ විධි නව තාක්ෂණය යොදා ගනිමින් පවත්වා ගත යුතු යැයි අනුදනී.

- දුර්වල සාමාජීය හා පාරිසරික හැසිරීම් රටාව නිසා මහජන සුභ සිද්ධියට, පරිසරයට, සෞඛ්‍යයට හා ජීවනෝපායන්ට තර්ජනයක් වන ජලයේ ගුණාත්මකභාවය අඩු වීම ගැන කණගාටු වන අතර එය නැති කර ගැනීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ සහාය අපේක්ෂා කෙරේ.

- ඒකාබද්ධ ජල සම්පත් කළමණාකරණයක් සඳහා ආයතනික ව්‍යුහයක් ඇති කිරීමේදී සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් තීරණ ගන්නා විනිවිදභාවය, සමානාත්මතාවය හා කාන්තා අයිතිය සුරැකෙන ලෙස එය ඉටුකිරීමට සහාය වේ.

- ජල සම්පතේ භාරකරු වශයෙන් මහජනතාවට කාර්යක්ෂම සේවයක් සලසනු වස් ජලය එහි කළමණාකරණයට පළාත් පාලන ආයතන, මහජන සංවිධාන, පුද්ගලික අංශයන්ට අවස්ථානෝචිත පරිදි සුදුසු බලයන්ට විමධ්‍යගත කිරීම හා පවරා දීමට ලංකා ජල සංසදය සහයෝගය පල කරයි.

- පරම්පරාවන් අතර සමානාත්මතාවය ගරු කරන අතර එය ඉලක්කය කරා යෑමට යහපත් ජල පාලනයක් අපේක්ෂා කෙරේ.

**ශ්‍රී ලංකා ජල සංසදය**

127, සුනිල් මාවත, බත්තරමුල්ල, පැලවත්ත.

දුරකථන 94112880000 ෆැක්ස් 94112786854

ඊ මේල් slnwp@cgiar.org වෙබ් අඩවිය www.lankajalani.org